ප්‍රවේශ්‍යතා ප්‍රතිපත්තිය

I වන අනුවාදය

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

2024 නොවැම්බර්

පටුන

1. හැඳින්වීම 3

2. වෙනස් කොට නොසැලකීම 4

3. සාධාරණ ලෙස සැලකීම සහ වගකිවයුතු ව්‍යාපාර චර්යා ධර්ම 4

4. ප්‍රවේශ්‍යතාව 5

5. විශේෂ අවධානය සහ නිසි රැකවරණය 8

6. සේවා නියුක්ති ප්‍රවේශ්‍යතාව සහ දැනුවත්භාවය 9

8. පාරිභාෂක පදමාලා 9

1. හැඳින්වීම

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (බැංකුව) විසින්, එහි සියලු ම ගනුදෙනුකරුවන්ට බැංකුවේ මූල්‍ය නිෂ්පාදන සහ සේවා වෙත ප්‍රවේශ වීමේ සම අවස්ථාවක් ඇති බව සහතික කිරීම සඳහා කැප වී කටයුතු කරයි. ඊට අනුකූලව, (මෙහි මින් මතු " විශේෂ අවශ්‍යතා" යනුවෙන් සඳහන් කරනු ලබන) වයෝවෘද්ධ, අබාධිත හෝ මූල්‍ය සාක්ෂරතාව අවම මූල්‍ය ගනුදෙනුකරුවන්ට අපගේ බැංකු සේවා වෙත සාධාරණ ප්‍රවේශය, ප්‍රයෝජ්‍යතාව සහ ඇතුළත්භාවය සැපයීමෙහිලා බැංකුවේ අරමුණු සහ ක්‍රියාකාරකම් විස්තර කිරීම, බැංකුවේ ප්‍රවේශ්‍යතා ප්‍රතිපත්තිය මගින් අරමුණු කරනු ලැබේ. ඒ අනුව, ප්‍රවේශ්‍යතාවය සහ ඇතුළත්භාවය වර්ධනය කරමින්, සියලු දෙනාටම බාධා විරහිත බැංකු අත්දැකීමක් සැපයීම සඳහා බැංකුව විසින් කටයුතු කළ යුතු ය. මෙම පියවර අනුගමනය කිරීම මගින්, විශේෂ අවශ්‍යතා ඇති මූල්‍ය ගනුදෙනුකරුවන්ට සමාන ප්‍රවේශයක් සැපයීම සඳහා ස්වකීය භෞතික හා ඩිජිටල් අවකාශ සකස් කර ඇති බව බැංකුව විසින් සහතික කරනු ලබයි. ප්‍රවේශ්‍යතාව හා සම්බන්ධ අදාළ නීති හා නියෝග සියල්ලට ම අනුකූලව කටයුතු කිරීම බැංකුවේ අරමුණ වේ.

මෙම තත්ත්වයන් මධ්‍යයයේ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ද, බැංකු පනතේ විධාන සහ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ නියෝග නිකුත් කිරීම ඇතුළු පියවර ක්‍රියාත්මක කර ඇත.. මූල්‍ය නිෂ්පාදන සහ සේවා වෙත සමාන ප්‍රවේශයක් ලබා දීම සඳහා, විශේෂ අවශ්‍යතා ඇති ගනුදෙනුකරුවන් ද ඇතුළුව, මූල්‍ය ගනුදෙනුකරුවන්ගේ විවිධත්වය නොසලකා හරිමින්, ඔවුන්ට බැංකු සේවා වෙත ප්‍රවේශ වීමේ හැකියාව ලබා දීමේ අවශ්‍යතාව මෙම විධාන/නියෝග මගින් අවධාරණය කරනු ලබයි.

විශේෂ අවශ්‍යතා සහිත මූල්‍ය ගනුදෙනුකරුවන් විසින් බැංකු සේවා වෙත ප්‍රවේශ වීම ඉහළ දැමීමේ අවශ්‍යතාව NDB බැංකුව විසින් පිළිගනු ලබයි. සියල්ලන්ගේ ම මූල්‍ය ස්වාධීනත්වය සහ යහපැවැත්ම දිරිමත් කරමින් සියල්ලන් ම ඇතුළත් වන බැංකු පරිසරයක් ස්ථාපිත කිරීම සඳහා වන පුළුල් ක්‍රියාමාර්ග වැඩි ප්‍රමාණයක් මීට ඇතුළත් වේ.

නියාමක විසින් පනවන ලද මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ නියෝගවලට අනුකූලව, ප්‍රවේශ්‍යතා ප්‍රතිපත්තිය බැංකුවේ ආයතනික වෙබ් අඩවියේ පළ කළ යුතු ය.

මෙම ලේඛනය පුරාවට, "බැංකුව" යන යෙදුම භාවිතා වන කවර හෝ අවස්ථාවක දී, අදාළ මෙහෙයුම/අන්තර් ක්‍රියාව හා සම්බන්ධ වූ අදාළ සියලු ම අංශ එයට ඇතුළත් වන බව තේරුම් ගත යුතු ය.

2. වෙනස් කොට නොසැලකීම

වර්තමාන සහ අනාගත ගනුදෙනුකරුවන්ට බැංකුව විසින් පිරිනමන මූල්‍ය නිෂ්පාදන සහ සේවා වෙත සාධාරණ සහ සමාන ප්‍රවේශයක් ලබා දීම කෙරෙහි සැලකිය යුතු අවධාරණයක් බැංකුව සිදු කරයි. මූල්‍ය සේවා ප්‍රදානය කිරීමට අදාළ නොවන, සමාජ තත්ත්වය, ශාරීරික ශක්‍යතාව, විවාහක/අවිවාහක බව, ජාතිය, කුලය, ස්ත්‍රී පුරුෂභාවය, වයස, ආගම හෝ මූල්‍ය සාක්ෂරතාව වැනි සාධක මත පදනම්ව වෙනස් කොට සැලකීම බැංකුව විසින් සිදු නොකළ යුතු ය.

බැංකු ගනුදෙනු කිරීමේ දී සහ/හෝ බැංකු සේවා ලබා ගැනීමේ දී, විශේෂ අවශ්‍යතා සහිත මූල්‍ය ගනුදෙනුකරුවන්ට සහාය ලැබෙන බව සහතික කිරීම සඳහා, ඔවුන්ට විශේෂ අවධානයක් ලබා දීමට බැංකුව සෑම ප්‍රයත්මයක් ම දරනු ඇත. මූල්‍ය ගනුදෙනුකරුවන්ට බැංකුව පිරිනමන නිෂ්පාදන සහ සේවා වෙත සාධාරණ ප්‍රවේශයක් ඇති බව මෙමගින් තහවුරු වනු ඇත.

3. සාධාරණ ලෙස සැලකීම සහ වගකිවයුතු ව්‍යාපාර චර්යා ධර්ම

3.1 මූල්‍ය පාරිභෝගිකයාගේ අත්සන

මහපට ඇඟිලි සලකුණු පිළිගැනීම සඳහා වන කාර්යපටිපාටියට යටත්ව සහ ඊට අනුකූලව මූල්‍ය ගනුදෙනුකරුගේ මහපට ඇඟිලි සලකුණ, සාම්ප්‍රදායික අත්සන හා සමානව සලකනු ලැබිය යුතු ය.

3.2 වෙනස්කොට සැලකීම පූර්ණ වශයෙන් ප්‍රතික්ෂේප කිරීම

ගනුදෙනුකරුවන් පිළිගැනීම සහ ඇතුළත් කර ගැනීමේ වාතාවරණයක් ප්‍රවර්ධනය කරමින්, කිසිදු හේතුවක් මත වෙනස් කොට සැලකීම පූර්ණ වශයෙන් ප්‍රතික්ෂේප කිරීමේ ප්‍රතිපත්තියක් බැංකුව විසින් ක්‍රියාත්මක කළ යුතු ය. මේ සඳහා පහසුකම් සැලසීම සඳහා, බැංකුව විසින්, විශේෂ අවශ්‍යතා සහිත මූල්‍ය ගනුදෙනුකරුවන් බැංකු සේවා වෙත සාධාරණව ප්‍රවේශ වීම

වළක්වන යම් බාධා තුරන් කිරීම සඳහා අභ්‍යන්තර ප්‍රතිපත්තීන් සහ කාර්යපටිපාටි කලින් කල සමාලෝචනය කළ යුතු ය.

4. ප්‍රවේශ්‍යතාව

4.1 ප්‍රවේශ්‍ය විය හැකි සේවා

4.1.1 භෞතික ප්‍රවේශය

බැංකුව විසින් නව ගොඩනැගිලි සහ භෞතික යටිතල පහසුකම් ඉදි කිරීමේ දී විවිධ හැකියා සහිත සහ වයෝවෘද්ධ ගනුදෙනුකරුවන් සඳහා පහසුකම් සැලසීම වැනි ප්‍රවේශ්‍යතාව හා සම්බන්ධ සමාන්‍ය නීතිවලට අනුකූලව කටයුතු කළ යුතු ය. බැංකුව විසින්, මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී අනුගත විය යුතු තාක්ෂණික වර්ගීකරණ වටහා ගැනීමට සහාය වන මාර්ගෝපදේශවල දක්වා ඇති නියාමන අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කිරීමට සෑම විට ම උත්සාහ කළ යුතු ය.

4.1.2 ඩිජිටල් සේවා

බැංකුව විසින්, විශේෂ අවශ්‍යතා සහිත පරිශීලකයන්ට ජංගම/ මාර්ගගත යෙදුම් සහ වෙබ් අඩවි වෙත ප්‍රවේශ වීමට හැකි බව තහවුරු කිරීම පිණිස කටයුතු කළ යුතු ය. පුළුල් පරාසයක් පිරික්සීමේ හැකියාව, පහසුවෙන් කියවීමේ හැකියාව, අවබෝධ කර ගැනීමේ පහසුව සහ කාර්යයන් ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දීම සහතික කිරීම ද මෙයට ඇතුළත් විය යුතු ය. ආරක්ෂාව, රැකවරණය සහ සුරක්ෂිතතාව පිළිබඳ සියලු ම අංග, පාඨ වශයෙන් සහ ශ්‍රව්‍යමය සැකසුම් වශයෙන් ආයතනික වෙබ් අඩවියේ සපයා ඇති බව බැංකුව විසින් තහවුරු කළ යුතු ය. ඉදිරිපෙළ කාර්ය මණ්ඩලය විසින්, අවශ්‍ය අවස්ථාවල දී, දෘශ්‍යතාවය වර්ධනය කිරීම පිණිස මූල්‍ය ගනුදෙනුකරුවන්ගේ අදාළ උපාංග සැකසුම් හරහා අක්ෂරවල ප්‍රමාණය, වර්ණ, වර්ණවල වෙනස යනාදිය වෙනස් කරනු ලබන ආකාරය පිළිබඳව ඔවුන්ට මගපෙන්විය යුතු ය.

4.1.3 ගනුදෙනුකරුවන් සඳහා සහාය දැක්වීම

බැංකුව විසින්, දුරකතන, විද්‍යුත් ලිපින සහ පෞද්ගලික සහාය ඇතුළු විවිධ ක්‍රමවේද හරහා ගනුදෙනුකරුවන්ට සහාය දැක්විය යුතු ය. අවශ්‍ය අවස්ථාවන්හි දී උපකාරක තාක්ෂණය සහ

උපකරණ භාවිත කිරීම සඳහා බැංකුව විසින් මූල්‍ය ගනුදෙනුකරුවන්ට ප්‍රමාණවත් පහසුකම් සැපයිය යුතු ය.

4.1.4 ගනුදෙනුකරුවන්ගේ ප්‍රතිචාර

ප්‍රවේශ්‍යතාව හා සම්බන්ධ ගැටළු පිළිබඳ ගනුදෙනුකරුගේ පසුවිපරම සම්බන්ධයෙන් බැංකුව විසින් දිරිමත් කළ යුතු මෙන්ම එම පසුවිපරම පිළිගනු ලැබිය යුතු ය.

4.2 ලේඛන සන්නිවේදනය සහ තොරතුරු

බැංකුව මගින් පිරිනමනු ලබන නිෂ්පාදන සහ සේවා පිළිබඳ දැනුවත්භාවයෙන් යුතු තීරණ ගැනීම සඳහා මූල්‍ය ගනුදෙනුකරුවන්ට අවශ්‍ය අදාළ ලිපිලේඛන, නියම හා කොන්දේසි සහ වෙනත් ප්‍රමාණවත් දත්ත වෙත ප්‍රවේශ වීමේ හැකියාව ඇති බව බැංකුව විසින් සහතික කළ යුතු ය. බැංකුව විසින් සපයන තොරතුරු, මූල්‍ය ගනුදෙනුකරුගේ කැමැත්ත පරිදි ඉංග්‍රීසි, දෙමළ හෝ සිංහල භාෂාවෙන් පැහැදිලිව සහ තේරුම්ගත හැකි පරිදි තිබිය යුතු ය.

අවශ්‍ය අවස්ථාවන්හි දී, ස්වකීය බැංකු අවශ්‍යතා සඳහා සහාය ලබා ගැනීමට ස්වකීය තේරීම මත නම් කරනු ලබන පුද්ගලයකු පත් කිරීමට බැංකුව විසින් මූල්‍ය ගනුදෙනුකරුට ඉඩ ලබා දිය යුතු ය. එකී බලය පැවරීම, මූල්‍ය ගනුදෙනුකරු විසින්, බලය දෙන ලිපියක්, ඇටෝර්නි බලපත්‍රයක් හෝ බැංකුව විසින් පිළිගනු ලබන අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතයක් මාර්ගයෙන් ලබා දිය හැකි ය.

බැංකුව විසින්, පැමිණිලි සහ තොරතුරු සම්බන්ධයෙන් වන ඉල්ලීම් සකස් කිරීම සඳහා සන්නිවේදන ක්‍රමවේද කිහිපයක් පිහිටුවීමට සහ නඩත්තු කිරීමට අපේක්ෂා කරනු ඇත.

දෘශ්‍ය ආබාධ සහිත මූල්‍ය ගනුදෙනුකරුවන්ට බැංකු අත්දැකීම සඳහා පහසුකම් සැලැස්වීමට/ වර්ධනය කිරීමට කාල රාමු සහිත සැලසුම් සකස් කළ යුතු ය.

4.3 යටිතල පහසුකම්

රෝද පුටු, කිහිලිකරු, ඇවිදීමේ ආධාරක ආදිය භාවිත කරන ගනුදෙනුකරුවන් ඇතුළු විශේෂ අවශ්‍යතා සහිත සහ වයෝවෘද්ධ මූල්‍ය ගනුදෙනුකරුවන්ට ද, ගොඩනැගිලි, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATMs) සහ මුදල් ප්‍රතිචක්‍රීකරණ යන්ත්‍ර (CRMs) වැනි ස්වයං සේවා යන්ත්‍ර (SSMs) වැනි බැංකුවේ යටිතල පහසුකම් වෙත ප්‍රවේශ වීමේ හැකියාව ඇති බවට බැංකුව විසින් සහතික කළ යුතු ය. බැංකු පරිශ්‍රයේ යටිතල පහසුකම් මගින් විවිධ හැකියාවන් සහිත සහ වයෝවෘද්ධ මූල්‍ය ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවලට පහසුකම් සැලසෙන බව සහතික කිරීම සඳහා ප්‍රවේශ්‍යතා අංග සහිත නව ගොඩනැගිලි සහ ATM සහ CRM වැනි ස්වයං සේවා යන්ත්‍ර ඉදි කිරීමේ දී බැංකුව විසින්, ඔවුන්ට සුදුසු නව ප්‍රවේශ්‍යතා අංග හඳුන්වා දීමට ප්‍රයත්න දැරිය යුතු ය. බැංකුවේ ගොඩනැගිලි, සේවා ප්‍රදේශ නිර්මාණය කිරීමේ දී සහ ඉදි කිරීමේ දී, සෑම විට ම නියාමන වර්ගීකරණවලට අනුගත විය යුතු ය.

4.4 වෙබ් සහ ජංගම යෙදවුම් වෙත ප්‍රවේශ්‍යතාව

බැංකුව විසින් ;

- විශේෂ අවශ්‍යතා සහිත මූල්‍ය ගනුදෙනුකරුවන් සඳහා පුළුල් සහ වැඩි දියුණු කළ ප්‍රවේශයක්, බැංකුවේ ආයතනික වෙබ් අඩවි සහ ඩිජිටල් නාලිකා මගින් සැපයෙන බව සහතික කිරීම සඳහා, බැංකුවේ එම ආයතනික වෙබ් අඩවියේ සහ ඩිජිටල් තාවකාලික අංග වෙනස් කිරීමට උපායමාර්ගික වශයෙන් පුළුල් පියවර ගත යුතු ය.

- මූල්‍ය ගනුදෙනුකරුගේ ඉල්ලීම මත, අවශ්‍ය ලේඛන ප්‍රවේශ වීමට පහසු ආකෘතිවලින් සහ කැමති භාෂාවකින් සැපයිය යුතු ය. විශේෂ අවශ්‍යතා සහිත ගනුදෙනුකරුවන්ට ස්වකීය බැංකු නිෂ්පාදන සහ සේවා වෙත ප්‍රවේශ විය හැකි බව සහ ඒවා පරිශීලක - හිතකාමී බව සහතික කිරීම සඳහා තත්ත්ව පාලක/සහතික කිරීමේ වැඩපිළිවෙලක් බැංකුව විසින් ස්ථාපිත කර තිබිය යුතු ය.

5. විශේෂ අවධානය සහ නිසි රැකවරණය

ගනුදෙනුකරුවන් බැංකුව හා සම්බන්ධ වන සියලු ම තැන්හී දී, විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා සාධාරණීය පිළිගැනීමක් සහිත පරිසරයක් නිර්මාණය කරමින්, විවිධත්වයෙන් යුතු සහ ඇතුළත්භාවයෙන් යුතු සංස්කෘතියක් ඇති කළ යුතු මෙන්ම, එකී මූල්‍ය ගනුදෙනුකරුවන් හඳුනා ගැනීමට සහ ඔවුන්ට විශේෂ අවධානයක් සහ නිසි රැකවරණයක් ලැබෙන බව සහතික කිරීම සඳහා කාර්යපටිපාටි ක්‍රියාත්මක කළ යුතු ය.

සියලු ම සේවා නියුක්තයන් විසින්, අබාධිත තත්ත්වය පිළිබඳ තොරතුරු පෞද්ගලිකව තබා ගැනීමට මූල්‍ය ගනුදෙනුකරුවන් සතු අයිතිවාසිකමට ගරු කළ යුතු අතර, බැංකු සේවා සැපයීමේ කාර්යය සඳහා පමණක් එම තොරතුරු භාවිත කරන බවට සහතික විය යුතු ය.

මීට අමතරව, විශේෂ අවශ්‍යතා සහිත මූල්‍ය ගනුදෙනුකරුවන්ට බැංකු නිෂ්පාදන/සේවා පිළිබඳ විස්තර සහිත තොරතුරු ලැබෙන බව සහතික කිරීම සඳහා අවශ්‍ය පරිදි කාර්යමණ්ඩලය යෙදවීමත්, බැංකුව හා සම්බන්ධ වීමේ දී හෝ ඉන්පසුව, ගනුදෙනු සඳහා හෝ බැංකු සේවා ලබාගැනීම සඳහා, අවශ්‍ය නම්, සහාය ලබා දීමත් බැංකුව විසින් සිදු කළ යුතු ය.

නව ATM/CRM සහ/හෝ වෙනත් ස්වයං සේවා යන්ත්‍ර සම්පාදනය කිරීමේ දී, බැංකුව විසින්, දෘෂ්‍යාබාධිත ගනුදෙනුකරුවන් සඳහා බ්‍රේල් පහසුකම සහිත යතුරුපුවරු සහ ආදාන/ප්‍රතිදාන ශ්‍රව්‍ය පහසුකම් වැනි ප්‍රවේශ්‍යතා අංග, වැදගත් ලෙස සැලකිය යුතු ය. බැංකුව විසින් නිකුත් කරන ලද කාඩ්පත් විශේෂ අවශ්‍යතා සහිත මූල්‍ය ගනුදෙනුකරුවන්ගේ ප්‍රවේශ්‍යතාව සහතික කිරීම සඳහා නිර්මාණය කර ඇති බව මෙමගින් තහවුරු විය යුතු ය.

බැංකු සේවා ලබා ගැනීමේ දී, එවැනි ප්‍රවේශ්‍යතා විකල්ප ලබා ගන්නා හෝ ඉල්ලුම් කරන මූල්‍ය ගනුදෙනුකරුවන් සඳහා බැංකුව විසින් අමතර අයකිරීම් හෝ ගාස්තු අය නොකළ යුතු ය.

6. සේවා නියුක්තික ප්‍රවේශ්‍යතාව සහ දැනුවත්භාවය

6.1 සේවා නියුක්ති භාවිතයන්

බැංකුව විසින්, සේවා නියුක්තිය සඳහා පුද්ගලයන් සලකා බැලීමේ දී, ආබාධිත තත්ත්වය මත පදනම්ව වෙනස් කොට සැලකීම සිදු නොකළ යුතු අතර, සාධාරණ සේවා නියුක්තියක් සැපයීම සඳහා කැප විය යුතු ය. අබාධිත හෝ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ට රැකියා අවස්ථා සඳහා සමාන ප්‍රවේශයක් මෙන් ම ඔවුන්ගේ රැකියාවේ රාජකාරි ඵලදායීව ඉටු කිරීමට හැකි බව සහතික කිරීම සඳහා, බැංකුව විසින්, බඳවා ගැනීමේ පටිපාටිය සහ සේවා නියුක්තිය සිදු කෙරෙන කාලසීමාව පුරාම සාධාරණ ප්‍රවේශයක් සැපයිය යුතු ය.

6.2 පුහුණුව සහ දැනුවත්භාවය

ඇතුළත්භාවයෙන් යුත් පරිසරයක් නිර්මාණය කිරීමෙහිලා ස්වකීය භූමිකා සහ වගකීම් කාර්යමණ්ඩලය විසින් වටහාගන්නා බව සහතික කිරීම සඳහා, බැංකුව විසින්, කලින් කල, ප්‍රවේශ්‍යතා සහ ආබාධිතභාවය සම්බන්ධයෙන් වන දැනුවත්භාවය පිළිබඳ පුහුණු වැඩසටහන් සැපයිය යුතු ය. ප්‍රවේශ්‍යතාවට අදාළ ප්‍රශස්ත භාවිතයන් සහ නෛතික අවශ්‍යතා පිළිබඳව දැනට පවත්නා අධ්‍යාපනය සහ යාවත්කාලීන වූ තොරතුරු බැංකුව විසින් සැපයිය යුතු ය.

8. පාරිභාෂික පදමාලා

- "ප්‍රවේශය" යන්නෙන්, යම් පොදු ගොඩනැගිල්ලක හෝ පොදු ස්ථානයක, සහ එමගින් සපයනු ලබන පහසුකම් සහ සේවා වෙත, හෝ පොදු සේවා ඇති යම් ස්ථානයකට, වෙනත් යම් තැනැත්තකුගේ සහායකින් තොරව ඇතුළු වීමට, ප්‍රවේශ වීමට, ඒ වෙත යෑමට හෝ ඉන් බැහැරව යාමට සහ භාවිත කිරීමට යම් තැනැත්තකුට ඇති හැකියාව අදහස් වේ.

- "ආබාධිත" යන්නෙන්, මනෝවිද්‍යාත්මක, කායික හෝ ව්‍යවච්ඡේදක ව්‍යුහය හෝ කර්තව්‍ය සම්බන්ධ තාවකාලික හෝ ස්ථිර අහිමිවීමක් හෝ අසාමාන්‍යතාවක් අදහස් වන අතර, මානසික ක්‍රියාකාරීත්ව පද්ධතිය ද ඇතුළුව ශරීරයේ අවයවයක, ඉන්ද්‍රියයක සහ පටකයක විෂමතාවක්, දෝෂයක් හෝ නොමැති වීමක් හෝ එවැනි තත්ත්වයක් උද්ගත වීමක් ද මෙයට ඇතුළත් වේ.

- "අබාධ සහිත තැනැත්තක්" යන්නෙන්, 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත යටතේ එම යෙදුමට පවරා ඇති අර්ථය ම තිබිය යුතු ය.